**ශීර්ෂය 04 - උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු හි 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු හි මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 19 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ආයතනයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 02 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ආයතනය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ආයතනයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන**,** වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්**,** ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර**,** එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්**,** ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ SA - 82 හි මූල්‍ය නොවන වත්කම්වල ශේෂයක් දක්වා නොතිබුණත්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ සහ එහි සංචිතය ලෙස රු.609,890,813 ක් දක්වා තිබුණි. එය ආයතනයේ සිගාස්වල ඇතුලත් වත්කම් වාර්තාවේ වටිනාකම විය. ඒ අනුව 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි 3.2 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සංඛ්‍යා අවසාන භාණ්ඩාගාර ගිණුම්වල දක්වා ඇති සංඛ්‍යා සමඟ එකගවන බවට සහතික වී නොතිබුණි. එසේම 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 02 හි සඳහන් පරිදි භාණ්ඩාගාර මාසික ගිණුම් ප්‍රකාශනයන් සමඟ අදාල ආයතනයේ ගිණුම් විධිමත් පරිදි සසඳා නොතිබූ අතර පවතින වෙනස්කම් එළඹෙන මාසයේ මාසික ගිණුම් සාරාංශය මගින් නිවැරදි කිරීමට ද කටයුතු කර නොතිබුණි. | 2021.12.31 දිනට සිගාස් වැඩසටහන්වල ඇතුලත් වත්කම් වටිනාකම භාණ්ඩාගාරයේ වත්කම් ශේෂය සමඟ සැසදේ. නමුත් තාක්ෂණික දෝෂයක් හේතුවෙන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ (SA-82) වාර්තාව 2021 වර්ෂය සඳහා ලබා ගැනීමට නොහැකි විය. එම අගයන් තහවුරු කිරීමට 2022.04.26 දින භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ (SA-82) වාර්තාව ලබාගෙන ඇත. | 2020 අගෝස්තු 08 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 02 සහ 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි 3.2 ඡේදය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

### 1.6.2 ලේඛණ විධිමත්ව පවත්වා නොතිබීම

පහත දැක්වෙන ලේඛණ විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බැරකම් පිළිබඳ ලේඛණය<br>2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණු රු.947,954 ක බැරකම්, බැරකම් ලේඛනයක ඇතුලත් කර තිබුණත්, එහි බැරකම් නිරවුල්කිරිම සම්බන්ධයෙන් තොරතුරු ඇතුලත් කර නොතිබුණි. | බැරකම් නිරවුල් කිරිම සම්බන්ධ තොරතුරු බැරකම් ලේඛණයේ ඇතුළත් කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කලහැකි පරිදි බැරකම් ලේඛණය යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු වේ. |
| (ආ) | අත්තිකාරම් පාලන ගිණුම<br>පවත්වාගෙන යනු ලබන අත්තිකාරම් පාලන ගිණුම නිසි පරිදි ලියා, මාස්පතා භාණ්ඩාගාර පොත් සමඟ දෙපර්තමේන්තු පොත් සසදා නොතිබු අතර 2021 දෙසැම්බර් 31 දිනට රු.2,022,301 ක් වූ ශේෂය පෙන්වා නොතිබුණි. | 2021 වර්ෂයේ පැවති විවිධ හේතුන් මත අත්තිකාරම් පාලන ගිණුම නිසි පරිදි මාසිකව සැසදීමට නොහැකි වු අතර 2022 වර්ෂයේ එය ක්‍රමවත්ව සිදුකර ඇත. | 2017 ජුලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව අත්තිකාරම් පාලන ගිණුම නිසි පරිදි ලියා ශේෂ කලයුතු අතර මාසිකව භාණ්ඩාගාර පොත් සමඟ දෙපාර්තමේන්තු පොත් සැසඳිය යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයන් 5 ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් සලසාගෙන තිබුණු එකතුව රු.13,300,000 ක් වූ ප්‍රතිපාදනවලට අමතරව පරිපූරක ඇස්තමේන්තු මගින් එකතුව රු.7,400,000 ක ප්‍රතිපාදන ලබාගෙන එම රු.20,700,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි. | 04-01-01-1102 සහ 04-01-02-1102 යන වැය විෂයන් සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් රු.10,000,000 බැගින් ඉල්ලීම් සිදු කර ඇතත් ප්‍රතිපාදන ලබා දී ඇත්තේ රු.4,500,000 බැගිනි. අනෙකුත් වැය විෂයන් වලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් පරිපූරක ප්‍රතිපාදන සලසාගෙන ඇත.<br>එහෙත් 2021.08.28 දිනැති "රාජ්‍ය වියදම් සමාලෝචනය" පිළිබඳ සංදේශයට අනුව මෙම වැය විෂයන්වල ප්‍රතිපාදන අවුරා එම තොරතුරු භාණ්ඩාගාරයට දන්වා යවා ඇත. | ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ඇස්තමේන්තු සකස් කරන බැවින් පුරෝකථනය කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කාර්යයන් අදාල කාලය තුල ඉටු කිරීමට ආයතනය කටයුතු කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වැය විෂයයන් 02 ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් සලසා ගෙන තිබුණු රු.600,000 ක් වූ මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනයම උපයෝජනයකර නොතිබුණි. | 2021.08.28 දිනැති "රාජ්‍ය වියදම් සමාලෝචනය "පිළිබඳ සංදේශයට අනුව මෙම වැය විෂයන් අවුරා තැබීමට කටයුතු කර ඇත. | ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ඇස්තමේන්තු සකස් කරන බැවින් පුරෝකථනය කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කාර්යයන් අදාල කාලය තුල ඉටු කිරීමට ආයතනය කටයුතු කල යුතු වේ. |
| (ඇ) | වාර්ෂික ඇස්තමේන්තුවෙන් සලසා ගෙන තිබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා පරිපූරක මගින් වැය විෂයයන්02 ක් සඳහා ලබාගෙන තිබූ රු. 5,750,000 ක ප්‍රතිපාදන වලින් මුදල් රෙගුලාසි 66 න් රු. 767,000 ක් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. | ඉදිරියේ දී මේ පිළිබඳව අවධානය යොමු කර කටයුතු කරමි. | ප්‍රතිපාදන අවශ්‍යතාවය නිසි ලෙස හඳුනාගත යුතු වේ. |
| (ඈ) | වැය විෂයයන් 06 ක් සඳහා සලසා ගෙන තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 44 සිට සියයට 99ක් වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | පිළිගනිමි. කොවිඩ්-19 වසංගත තත්වය මත කාර්යාල කටයුතු නිසි පරිදි සිදු නොවූ බැවින් ද රාජ්‍ය වියදම් කළමනාකරණය වැනි කරුණු ඇති වූ බැවින් ද අනපේක්ෂිත ලෙස වියදම් සීමා කිරීමට සිදු විය. | ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ඇස්තමේන්තු සකස් කරන බැවින් පුරෝකථනය කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කාර්යයන් අදාල කාලය තුල ඉටු කිරීමට ආයතනය කටයුතු කල යුතු වේ. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බැරකම් ප්‍රකාශයේ (සටහන iv) දක්වා තිබූ එකතුව රු.347,727 ක් වූ බැරකම් ශේෂයන් 03 ක් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ SA-92 ට ඇතුලත් කර නොතිබුණි. | සිගාස් වැඩසටහනේ බැරකම් ලෙස ඇතුලත් කර ඇති නමුත් තාක්ෂණික දෝෂයක් නිසා භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ SA-92 වාර්තාව | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.2 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සංඛ්‍යා, අවසාන භාණ්ඩාගාර ගිණුම් |

| | | | |
|---|---|---|---|
| | | මගින් 2021 වර්ෂයට අදාල දත්ත නිරූපණය විය. | ප්‍රකාශනවල දක්වා ඇති ශේෂයන් සමඟ එකඟ වන බවට සහතික විය යුතු වේ. |
| (ආ) | නිල රථ අළුත්වැඩියාව වෙනුවෙන් ගෙවිය යුතු රු.125,000 ක් බැදීම් හා බැරකම් පිලිබඳ ප්‍රකාශයේ (සටහන්III) ඇතුලත් කරනවා වෙනුවට මුදල් රෙගුලාසි 94 (2) සහ (3) ප්‍රකාරව එළඹෙන ලද බැරකම් පිළිබඳ ප්‍රකාශයේ (සටහන් IV) හි ඇතුලත් කර තිබුණි. | ගෙවිය යුතු රු.125,000 කට අදාල වවුචර් පත ජනවාරි මාසයේ දි ලැබී ඇති බැවින් අතපසු වීමකින් සටහන් IV ට ඇතුළත් කර ඇත. | තොරතුරු නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කල යුතු වේ. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රිති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසිවලට යොමු | වටිනාකම | අනුකූල නොවීම | | |
| | | රු. | | | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| | i. මුදල් රෙගුලාසි **104** | 6,348,644 | මූල්‍ය ප්‍රකාශනවල සටහන් (II) යටතේ දක්වා තිබුණු වාහන අනතුරු 06 ක අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මු.රෙ. 104 අනුව කටයුතු කිරීමට 2022 වර්ෂයේ සිට පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| ii. | මුදල් රෙගුලාසි **365 (3)** | 1,987,200 | අග්‍රිමයන්ට අයත් මුදල් එයට නියමිත මුදල් වර්ෂයෙන් අන්‍ය වූ මුදල් වර්ෂයක ගෙවීම් පියවීම සඳහා යොදා නොගත යුතු බව දක්වා තිබුණත් 2022 ජනවාරි මාසයට නියමිත ඉන්ධන දීමනාව වූ අංක 429 දරන වවුචරයෙන් 2021 දෙසැම්බර් 30 දින ගෙවා තිබුණි. | ඉන්ධන දීමනාව වර්ෂයට අදාලව ගෙවීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |
| iii. | මුදල් රෙගුලාසි **371 (2) (ආ)** | 173,600 | විශේෂිත කාර්යයක් සඳහා ලබා දෙන අතුරු අග්‍රිම එම කාර්යය නිමකල විගසම පියවිය යුතු වුවද, අවස්ථා 04 කදී ලබා දී තිබුණු අත්තිකාරම් මුදල්, විගණිත දිනය වූ 2021 දෙසැම්බර් 29 දිනට අත්තිකාරම් ලබා දී මාස 02 දින 15 ක සිට මාස 11 දක්වා කාල පරාසයක් ගත වී තිබුණද පියවා නොතිබුණි. | ලබාගන්නා අග්‍රිම කාර්යය නිම වූ විගසම පියවීම සඳහා නිලධාරීන් දැනුවත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |
| iv. | මුදල් රෙගුලාසි **1645 (අ)** | 1,739,378 | වාහන සේවා කිරීම්, රු.මිලියන 12 ඉක්ම වූ වාහන අලුත්වැඩියා වියදම් සහ 2021 නොවැම්බර් 30 දින වන විට වාහන 12කට ටයර් යෙදීම වෙනුවෙන් වියදම් ලොග් සටහන් පොත්වල සටහන් කර නොතිබූ අතර ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට ප්‍රවාහන විෂයභාර නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 06 ඡේදය | – | නිල වාහන සඳහා චක්‍රලේඛය මඟින් හඳුන්වා දී තිබුණු ප්‍රවාහන සේවා සටහන එක් එක් මාසයේ රාජකාරි සඳහා සම්පූර්ණ කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමට ප්‍රවාහන විෂයභාර නිලධාරියා දැනුවත් කරන ලදී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු වේ. |
| (ඇ) 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ | | | | |
| i. 3.1 වගන්තිය | – | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ සිගාස් ඩෙක්ස්ටොප් යෙදුම මඟින් උත්පාදනය කරන ලද ශේෂ පිරික්සුම ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේ දී නිසි පරිදි ශේෂ පිරික්සුම අමුණා ඉදිරිපත් කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු වේ. |
| ii. 3.4 වගන්තිය | – | එක් එක් වැය විෂයය සංකේතාංකයක් යටතේ සෑම වැය විෂයයක් වෙනුවෙන්ම මුළු ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර වෙනස හා එම වෙනසට හේතු ඒසීඒ - 2 (II) ආකෘතියෙහි දැක්විය යුතු වුවත්, වැය විෂයයන් 2 ක ඉතිරි වීම් සඳහා හේතු ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේ දී එක් එක් වැය විෂයන්ගේ ඉතිරිවීම් සඳහා හේතු දැක්වීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු වේ. |
| iii. 3.7 වගන්තිය | – | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සියලුම අගයන් ආසන්න රුපියලට වාර්තා කල යුතු වුවත්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සැකසීමේ දී ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේ දී අගයන් ආසන්න රුපියලට වාර්තා කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු වේ. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය ශීර්ෂ 04 හි ප්‍රතිපාදන මඟින් 2021 වර්ෂයේ මිල දී ගෙන තිබුණු රු.9,383,680 ක් වටිනා කාර්යාලීය උපකරණද, රු.5,595,188 ක් වටිනා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ද වැය ශීර්ෂ 234 ට අදාල බඩු වට්ටෝරු පොතට ඇතුලත් කර තිබුණු අතර වැය ශීර්ෂ 04 වෙනුවෙන් වෙනමම බඩු වට්ටෝරු පොතක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ශීර්ෂ අංක 04 සඳහා වෙනම බඩු වට්ටෝරු පොතක් පවත්වාගෙන යාම සිදු කර නොමැති අතර ඉදිරියේ දී මෙය විධිමත් කිරීමට පියවර ගනු ලැබේ. | මුදල් රෙගුලාසි 454 (1) ප්‍රකාරව බඩු ලේඛණ පොතක් තබාගත යුතු වේ. |
| (ආ) | 2013 වර්ෂයේ දී අධිකරණ අමාත්‍යාංශයෙන් ලබා දී තිබුණු වාහනයක අයිතිය 2022 මාර්තු වන විටත් උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු ආයතනය වෙත විධිමත්ව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. නමුත් කොම්ප්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලද වාහන ලැයිස්තුවෙහි මෙම වාහනය ආයතනයට අයිති බව දක්වා තිබුණි. | අදාල වාහනය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති. | විධිමත්ව පවරා ගැනීමට කටයුතු කල යුතුවේ. |

**3.2** පාඩු හා හානි

--------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | ප්‍රනිර්දේශය |
| --- | --- | --- |
| වාහනයකට 2020 නොවැම්බර් 22 දින සිදු වී තිබුණු අනතුර සම්බන්ධයෙන් වූ රු.180,712 ක අලාභය 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල සටහන (i) හි තවදුරටත් අයකර ගැනිමට ඇති එම පාඩුවෙහි කාල විශ්ලේෂණය දක්වා නොතිබුණි. | අලාභය අය කර ගැනිමට රක්ෂණ ආයතනය සමඟ සාකච්ජා පවත්වන අතර එය කාල විශ්ලේෂණයට අනුව අවුරුදු 05කට අඩු විය යුතුය. එය නිවැරදි කිරිමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල අදාල තොරතුරු සම්පූර්ණ කලයුතු වේ. |

**4.** යහපාලනය

--------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01 – 2019 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙන් අවධාරණය කර ඇති පරිදි මුදල් රෙගුලාසි 134 හා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (3) වගන්තිය ප්‍රකාරව ආයතනයේ අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණු අතර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි. | ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව සතුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොමැති අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් අදාල කාර්යයන් සිදු කරනු ලැබේ. | දක්වා ඇති නීතිරීති, රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතු වේ. |